

# ලෝකෝත්පත්තිය සහ ලෝක විනාශය

# පෙරවදන

**ලෝකෝත්පත්තිය සහ ලෝක විනාශය**

රාජ්‍ය වර්ෂ 2016 මාර්තු 22 වැනි නවම් පුර පසළොස්වක දින දිය. **නමො තස්ස භගවතෝ අරහතො සම්මා සම්බුද්ධස්ස !!!**

ඉහත සඳහන් නමින් ක්‍රිස්තු වර්ෂ 2009 වර්ෂයෙහිදි නිමලව අරණ්‍ය සේනාසනයෙහි වැඩසිටි සමයෙහි උම්මග්ග ජාතකයට අමතරව "ලෝකෝත්පත්තිය නමින් දහම් ග්‍රන්ථයක් එහි පුස්තකාලයෙහි තිබුණු පොත් වහන්සේ නමක් උපයෝගී කරගෙන සංස්කරණය කරන ලදී. එහි ලෝක විනාශය ගින්නෙන්, ජලයෙන්, වායුවෙන් විනාශවන ආකාරය මැනවින් පෙන්වා දී ඇත. මේ වනවිට එම දහම් ග්‍රන්ථය මා සන්තකයෙහි නැත. එවැනි පැරණි පොතක් සොයා ගැනීමට දුෂ්කර වීමෙන් සහ මාගේ අපවත් වීමේ කාලය ඉතා ඉක්මනින් ලංවීමත් මතක සිටීමේ ශක්තිය දුර්වලවීමත් නිසා වර්තමානයේ මුද්‍රණය කර තිබූ (අඩුපාඩු සහිත) පොතක ගින්නෙන් විනාශ වන කල්පය ගැන පමණක් විස්තර තිබීමත් එය මාගේ සිතට එකඟවීමත් නිසා එම පොත් වහන්සේ උපයෝගී කරගෙන මෙමම දහම් ග්‍රන්ථය සංස්කරණය කරමි.

**මීට හිතැති,**
**පූජ්‍ය අකුරෙගොඩ රතනසාර හිමි**
**ගුණරත්න යෝගාශ්‍රමය,**
**තල්වත්ත, කැළණිය.**

නමො තස්ස භගවතෝ අරහතො සම්මා සම්බුද්ධස්ස !!!

# කල්ප විනාශය

**(අංක 23)**

එක් සමයෙක්හි අප භාග්‍යවත් අර්හත් සම්මා සම්බුදු රජාණන් වහන්සේ විසල් නුවර අම්බපාලිවනයෙහි වැඩ වසන සේක. එහිදී අපගේ භාග්‍යවතුන් වහන්සේ එක් දිනක් ''මහණෙනි, යි භික්ෂූන් අමතූ සේක. 'ස්වාමිණි' යි එහි රැස්ව සිටි භික්ෂුන් භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දුන් සේක. ඉන්පසු බුදුරජාණන් වහන්සේ මෙම කාරණය වදාළ සේක.

''මහණෙනි, සංස්කාරයෝ අනිත්‍යය හා සංස්කාරයො අස්ථිරයහ, මහණෙනි, සංස්කාරයෝ අනාශ්වාසිකයහ. මහණෙනි, සර්ව සංස්කාරයන්හි තත්වය යථා ස්වභාවයෙන් දැනගැනීමට මෙම කරුණම ප්‍රමාණවත් මැයි. විරාග දැනවිමට ප්‍රමාණවත්මයි. එම නිසා සසර දුකෙන්, භියෙන්, සසර බැඳීම් වලින් මිදීමට මෙම කාරණාව අවබෝධ කර ගැනීමට ප්‍රමාණවත් වේ.

''මහණෙනි, මහාමේරු පර්වතයෙහි වට ප්‍රමාණය යොදුන් අසූහාර දහසකි. (යොදුනක දිග සැතපුම් 16 කි.) එම මහාමේරු පර්වතය යොදුන් අසූහාර දහස් ගැඹුරු සාගරයෙහි පතුලටම කිඳී තිබේ. එසේම සාගරය මතුපිටින් යොදුන් අසූහාර දහසක් උසට අහසට මතුව තිබේ.

''මහණෙනි, අති දීර්ඝ කාලයක් ගෙවීයාමේදී බොහෝ කාලාන්තරයක් වර්ෂ කෝටි ගණනක් වර්ෂා ජලය (වැසි නැති) නොමැති කාලයක් උදාවන්නේය. එවන් කාලයක් යම් කාලයක උදාවන්නේය. ''මහණෙනි, වැස්ස නැතිව මෙවන් කාලයක් ගෙවීයාමේදී, වෘක්ෂ ලතාදිය වැඩීම නොවන්නේය. තිබෙන ගස්වැල් සියල්ලක්ම වියලි යන්නේය. නැවත වැඩීමක් නොවන්නේය.

'මහණෙනි, මෙම කාරණයම කමටහනට වඩා භාවනානුයෝගීව සියලු සංස්කාරයෝ අනිත්‍යය, ආනාත්මය, ආශ්වාස

රහිතය. 'මහණෙනි, සර්ව සංස්කාරයන්හි කළකිරීමට, භවදුක සිඳ දැමීමට, සසරින් මිදීමට, සසර නොඇලීමට මෙපමණමැයි.

''මහණෙනි, මෙසේ අධික වියලි ස්වභාවයෙන් (වැසිනැතිව) දැඩි අව් රශ්මියෙන් තවත් දීර්ඝ කාලාන්තරයක් ගෙවී යන කල දෙවන සූර්‍ය්‍යයෙක්ද උදාවේ. දෙවන සූර්‍ය්‍යයා ගේ උදාවීමෙන් පසු ඇල, දොළ, කුඩා වැව් පොකුණු ආදිය සිඳී වියලී යන්නේය. නැවත වැසි ලැබීමක් නොවන්නේය. නැවත එකී වැව් පොකුණු ඇළ, දොළ කුඩා ගංගාවන්ගේ වැඩීමක් නොවන්නේය.

මහණෙනි, මෙසෙයින් සංස්කාරයෝ අනිසයහ. මෙසෙයින් සංස්කාරයෝ අස්ථිරයහ, අනාශ්වාසිකයහ. සර්වසංස්කාරයන්හි නිර්වේදයට මෙයම ප්‍රමාණ වෙයි. විරාගයට මෙම පමණවෙයි. විමොක්ෂයට මෙම ප්‍රමාණ වෙයි.

'මහණෙනි, තවත් අතිදීර්ඝ කාලයක් ගෙවී යාමේදී තුන්වන සූර්යෙක් ද උදාවේ. එම තුන්වන සූර්යාගේ උදාවීමෙන් පසු ගංගානම් ගඟ, යමුනා ගඟ, අචිරවතිය, සරභූමහී කියන ගංගාවන් පහම දිය සිඳී නැවත වැඩීමක් නැති වියලි කාන්තාර බවට පත්වේ. තුන්වන සූර්යා උදාවීමට පෙරම අපේ රටේ තිබෙන මහවැලි, කැළණි, ආදී සියළුම ගංගාවන් සිඳී වියලී කාන්තාර බවට පත්වී අවසානයි. පෘතුවියෙහි තිබෙන ඒ හා සමාන අනෙකුත් ගංගා, වැව්, පොකුණු ආදියද ඒ වනවිට තද රශ්මි පිටකරන විශාල වලවල් බවට පත්වී අවසානය. තවද එකී තුන්වන සූර්යාගේ පහළ වීමෙන් පසු එක් සූර්යෙක් බටහිරින් බැස යන අතර තව සූර්යෙක් අහසෙ මුදුන් වන අතර අනෙක් සූර්යා පෙරදිගින් උදාවන්නේය.

මේ සා විශාල දිග, පළල, ගැඹුරු මොහොතක් පාසා අතිවිශාල ජලස්කන්ධයක් මොහොතකුදු නොනැවතී සාගරයට ගෙන යන පඤ්ච මහා ගංගාවෝ මෙසේ වෙත් නම්, එයම කමටහනට ගෙන මමය, මටය, මගේය කියා මොනවද ඉතිරි වන්නේ එයම කමටහනට ගෙන භාවනාවට ගෙන විදර්ශනා භාවනා වඩා අහෝ සසර දුකයි, අහෝ සසර භියයි. සසරින් මිදීමම සැපයි කියන පණිවිඩය අපට ලැබුනේ අති

දුර්ලභව ලබාගත් මිනිසත් ආත්ම භාවයේ සම්මා සම්බුදුරජාණන් වහන්සේ නමක් පහළවීම නිසා නොවේද? මෙකී අනාගත වන සිද්ධීන් අප වෙත කාගෙන් දැනගන්නෙමුද? එම නිසා අපගේ තිබෙන සියළුම තෘෂ්ණාවන් දුරුකර ගැනීමට මෙයම ප්‍රමාණවත්ය.

''මහණෙනි, මෙසේ තවත් අති දීර්ඝ කාලයක් ගෙවීයාමේදි යම්කිසි කාලයකදී හතරවන සූර්යයෙක්ද පහළ වන්නේය. තුන්වන සූර්යයාගේ සිට හතරවන සූර්යයා දක්වා ඇති කාලය තුල එකී ගංගාවන් සිඳුවා දැඩි රශ්මිය එක්කල ගංගා නම් ගඟ, යමුනා ගඟ, අචිරවතී ගඟ, සරභූ සහ මහි නමැති මහා නදීහු සිඳී ගිය ආකාරයට යම් ස්ථානයකින් මෙම ගංගාවන්ට නිරන්තරයෙන් ජලය සැපයූ මහා විල් වූ අනවතප්ත, සිංහ ප්‍රපාතය, රථකාරය, කර්ණමුණ්ඩය, ෂඩ්දන්තය, මන්දාකිනිය යන ඒ මහා විල්ද වියලෙත් නැවත වැඩෙන්නේ නැත. සතර මහා සාගර හැර අනෙකුත් ලොව පුරා තිබෙන කුඩා මුහුදු පවා සිඳී වියලී යන්නේය.

මහණෙනි, තවත් එවැනිම අති දීර්ඝ කාලයක් ගෙවීයාමේදී යම් කලෙක පස්වන සූර්යයෙකුගේ උදාවද වන්නේය. මේ වනවිට රැයක් නොමැතිවම අහස පුරා සූර්යයන් පස්දෙනෙකුගේ ගමන වන්නේය. ''මහණෙනි, එවිට මහා සාගරයට නිරන්තරයෙන් ගලා එන ජලස්කන්ධය නොමැති වීමෙන් ද තනි සූර්යයාගේ පටන් 5 වන සූර්යයා දක්වා වර්ෂාව නොමැතිවීමෙන්ද අධික රශ්මිය හේතුවෙන්ද සතර මහා සාගරයෙහි ජලමට්ටම යොදුන් සිය ගණනින් ක්‍රම ක්‍රමයෙන් පහතට බැස අවසානයේදි මනුෂ්‍යයෙකුගෙ පා සටහන් වැසෙන තරමටවත් ජලය ඉතිරි නොවන්නේය. එයත් සිඳී ගොස් අවසානයේදි ඇඟිලි පුරුකක් තෙමා ගන්නා තරම්වත් ජල බිඳුවකුදු ඉතිරි නොවන්නේය.

මහණෙනි, මේ සා යොදුන් දහස් ගණන් දිග පළල ගැඹුරු සාගරයෙහි ඇඟිලි පුරුකකුදු තෙමා ගන්නවත් ජල බිඳුවක් ඉතිරි නොවුනා නම්, එයම තොපට, සංස්කාරයෝ අනිත්‍ය, දුක්ඛ, අනාත්ම භාවය අවබෝධ කරගෙන සසර දුකින් මිදීමට ප්‍රමාද නොවී උත්සාහ ගෙන භයානක දුක් සසර ගමන නිමා කිරීමට වීර්‍ය වඩව්.

මහණෙනි, තවත් එවැනිම අතිදීර්ඝ කාලයක් ගෙවීයාමේදි හයවන සූර්යයෙක් පහළ වේනම්, එබඳු කාලයක් වෙයි. මහණෙනි, හයවන හිරුගේ පහළ වීමෙන් මේ මහා පෘථිවිය සහ සුනේර පර්වතයද දුම්දමන්නේය. හාත්පසින් දුම් දමන්නේය. උළු පෝරණුවකින් ගඩොල් පෝරණුවකින් ගිනි ගැනිමට ප්‍රථම හාත්පසින් දුම් දමන්නාක් සේ මේ පෘථිවියෙහි තිබුණු සතර මහා සාගර ඇතුළු කිසිම තැනක ඇඟිලි පුරුකක් තෙමා ගන්නට තරම් ජල බිඳුවක්වත් නොමැති වූවාට ඒ වෙනුවට සැමතැනකින්ම නිකුත් වන්නේ අධික ගිනි ජාලයකට පසුබිම්වන දුමාරයක් පමණයි. මහණෙනි, තොප එයම කමටහණට ගෙන ඇතිවෙන තත්වයන් මතු අනාගතයෙහිදි මෙසේ මහාමේරු පර්වතය ජලයෙන් අසූහාරදහසක් යටට ගිලීද, ජලයෙන් උඩට තවත් යොදුන් අසූහාර දහසක් නැගි සිටින මෙකී පර්වත රාජ්‍යයන් සතර මහා ද්වීප ඇතුලු පෘථිවියත් ඉදිරි යම් කලෙක මෙසේ වන්නේ නම් මමය, මටය, මගේය කියා සිතන්න. තිබෙන්නේ තවත් මිරිඟුවක් නොවෙයිද්දයි කමටහනට ගෙන වහ වහා සසරින් මිදීමට උත්සුක වෙව.

මහණෙනි, තවත් එවැනිම අති දීර්ඝකාලයක් එලෙස ගෙවී යාමේදී හත්වන සූර්යයෙක් පහළ වෙයි. මහණෙනි, හත්වන හිරුගේ පහළවීමෙන් මේ මහා පොළොවද සුනේරු පවුරද ගිනිගෙන ඇවිලෙයි. දිලිසෙයි. එකම ගිනි ජාලාවක් බවට පත්වෙයි. මහණෙනි, මේ මහා පොළොවත්, සුනෙරු පවුරත් දැවෙත්, දැවෙත්ම වාතයෙන් ක්ෂිප්ත වූ අග්නිජාලාව සදිව්‍යලෝකයද ගින්නෙන් ඇවිලී එයින් ඈත පිහිටි බ්‍රහ්ම පාරිසජ්ජයද එයටත් ඉහළින් පිහිටි බ්‍රහ්ම පුරෝහිතයද, එයටත් ඈතින් පිහිටි මහා බ්‍රහ්ම ලෝකය දක්වාම මෙකී ගිනිජාලාව පැතිර පවත්නේය.

මහණෙනි, ඇවිලගත් දැවෙන වැනසෙන මහා ගිනි ජාලාවෙන් මර්දනය වූ සිනේරු පර්වතරාජයාගේ සියක් යොදුන් උස මහත කොටස් කැඩි කැඩී බිඳි බිඳී වැටෙයි. මෙයාකාරයට 200 - 300 - 400 - 500 යොදුන් උස මහත කොටස්, කොටස් වශයෙන් මහා ගිනි ජාලාවෙන් වසාගෙන ඇවිලගෙන, දිළිසෙමින් කැඩි කැඩී බිඳි බිඳී

වැටෙත්. එයාකාරයටම මේ මහා පෘථිවියේ සතර මහා සාගර ජලයෙන් පිරී ඉතිරී ගිය හිස්වූ කුහරද යොදුන් ගණන් උස මහත බිම් කොටස් හාත්පසින් ගිනිගෙන දිළිසෙන යොදුන් සියගණනින් උස මහත බිම්කොටස් ද කැඩී කැඩී බිඳී බිඳී මහා හෙන හඬ නගන අකුණු සැර විහිදුවමින් වැටෙන්නේය.

මහණෙනි, අග්නි ජාලාවෙන් වෙලී ඇවිලී දිළිසෙන මේ මහා පොළොවෙහිද සිනේරු පර්වත රාජයාගේ ද අළු හෝ දූලි කිසිවක් ඉතිරි නොවන්නේය. මහණෙනි, ගිනි ඇවිලී දූල්වෙන ගිතෙල් (එළගිතෙල්) ආදී තෙල් ආදියෙහි අළු හෝ දූලි නොහටගන්නා සේ ගිනි ඇවිලී විනාශවන මහපොළොවෙහිද මහාමේරු පර්වතයෙහිද ඒ කිසිවක් ඉතිරි නොවන්නේය.

මහණෙනි, මේ මහා පෘථිවිය හා මහාමේරු පර්වත රාජයා ගින්නෙන් දැවෙන්නාහ. වැනසෙන්නාහ. නොපවත්නාහ'' යි තොප සේ සතර මාර්ග ඵලයන්ට පත්වූවන් හැර අන් කවරෙක් අවබෝධ කරගැනීමට සමත් වේද? කවරෙක් පිළිගනීද?

මහණෙනි, අතීත භවයෙකි පඤ්චකාම රාගය නැති කල ''සුනෙත්ත'' නම් ශාස්තෘවරයෙකි. එම ශාස්තෘවරයාට විශාල ශ්‍රාවක පිරිසක් වූහ. මහණෙනි, සුනෙත්ත ශාස්තෘ තෙම එම පිරිසට බ්‍රහ්ම ලෝකෝත්පත්තිය සඳහා දහම් දෙසයි. මහණෙනි, බ්‍රහ්මලෝක සහභාවය සඳහා දහම් දෙසන සුනෙත්ත ශාස්තෘවරයාගේ අනුශාසනය යම් කෙනෙක් සර්වප්‍රකාරයෙන් දැනගත්තාහුද, ඔහු මරණින් පසු සුගති සංඛ්‍යාත බ්‍රහ්මලෝකයක උපදින්නාහ. යමෙක් එම ධර්මය සර්ප්‍රකාරයෙන් නොදනිත්ද ඔහු මරණින් පසු බ්‍රහ්මලෝකවලින් පහළ තිබෙන සදිව්‍ය ලෝකවලින් ඉහළම තිබෙන පරනිර්මිත වශවර්ති දෙව්ලොව උපදින්නාහ. ඇතැමෙක් නිර්මාණරතී දෙවියන්ගේ සහභාවයට පැමිණියහ. ඇතැමෙක් තුසිත දෙව්ලොව උපදින්නාහ. ඇතැමෙක් 'යාම' දෙව්ලොව උපදින්නාහ. ඇතැමෙක් තාවතිංස දෙවියන්ගේ සහභාවයට එන්නාහ. ඇතැමෙක් චාතුම්මහාරාජික දෙව්ලොවට එන්නාහ. ඇතැමෙක් ක්ෂත්‍රිය මහා සාරයන්ගේ (උසස් කුළ පරම්පරා) සහවාසයට එක්වන්නාහ, ඇතැමෙක් බ්‍රාහ්මන මහා

සාරයන්ගේ සහවාසයට එළඹියහ. ඇතැමෙක් ගෘහපති මහාසාරයන්ගේ සහභාවයට එළඹියහ.

මහණෙනි, ඉන්පසු සුනෙත්ත ශාස්තෘහට මෙවන් සිතක් ඇතිවිය. යම් විධියකින් මම මිය පරලොව ගිය පසු මාගේ ශ්‍රාවකයන්ට සමානව ඉපදුනොත් එය මට ලොකු මදිකමකි. එම නිසා මම මෙතැන් පටන් මෛත්‍රී ධ්‍යානය වඩන්නේ නම් හොඳයි. මහණෙනි, ඉන්පසු සුනෙත්ත ශාස්තෘ අවුරුදු හතක් මෙත් සිත් වැඩීය. හත් අවුරුද්දක් මෛත්‍රී වඩා සප්ත සංවත්‍ර-විවර්ත කල්පයක් පසුවට මේ මනුෂ්‍ය ලෝකයට පැමිණියේ නැත. මහණෙනි, ලොව නස්නා කල්හි ඔහු ආභස්සර බඹලොව උපදී නැවත ලෝකය සෑදෙන කාලයෙහි හිස් බ්‍රහ්ම විමානයක උත්පත්තිය ලබයි.

මහණෙනි, එම බ්‍රහ්ම රාජයා එහි සිටින සියලුම බ්‍රහ්මයන්ට ඉහළින් සිටියි. කිසිවෙකුට ඔහුගේ බලයට අභියෝග කල නොහැක. සියල්ල දක්නේ වශවර්ති වූයේ මහාබ්‍රහ්ම වෙයි. මහණෙනි, තිස්හත් වාරයක් ශක්‍ර දේවේන්ද්‍ර විය. අනෙක සියවාර ගණනාවක් සක්විති රජබවට පත්වූයේ ධාර්මික ධර්මරාජ වූයේ සතර මහා සාගරය මායිම් කොට සතර මහා ද්වීපයට අධිපති වූයේ සතුරන් දිනන ජනපදයන්හි ස්ථාවර භාවයට පැමිණියේ සත්රුවනින් සමන්විත විය. එතුමාට දක්ෂවූ සතුරු බල මඩනා පුත්‍රයන් දහසකට වඩා සිටියේය. මේ මහා පෘථිවියම තම අනසකට යටත්ව දස රාජ ධර්මයෙන් දිනා ඉසුරුමත්ව වාසය කළේය.

මහණෙනි, ඒ සුනත්ත ශාස්තෘ තෙම මේ සා දීර්ඝායුෂ්ක වූයේම මෙසේ චිරස්ථික වූයේම ජාතියෙන්, ජරා මරණයෙන්, ශෝකයෙන්, පරිදේවයෙන්, දුකින්, දොම්නසින් දූඩි ආයාසයෙන් මිදුනේ නැත. ඉපදීමේ දුකට හිමිකරු බව කියමි.

ඒ කුමක් නිසාද යත්, දහම් සතරක් හුගේ අවබෝධයක් නැතිකම නිසාය. අප්‍රතිවෙධයන කිනම් හතරක්ද? යත් ආර්යශීලයාගේ අනනුබෝධයෙන් අප්‍රතිවෙධයෙන, ආර්‍යසමාධිහුගේ ආර්‍ය ප්‍රඥාවගේ ආර්‍ය විමුක්තිහුගේ අනනුබෝධයෙන් හා අප්‍රතිවෙධයන.

මහණෙනි, එම ආර්යශීලය (මා විසින්) අනුබුද්ධය, ප්‍රතිවිද්ධය, ආර්ය සමාධිය අනුබුද්ධය, ප්‍රතිවිද්ධය, ආර්ය ප්‍රඥාව අනුබුද්ධය, ප්‍රතිවිද්ධය, ආර්ය විමුක්තිය අනුබුද්ධය, ප්‍රතිවිද්ධය, භවතෘෂ්ණාව නසන ලද භව රජ්ජුවක්ෂිණ විය. (අවසන් විය) දැන් පුනර්භවයක් නැත. බුදුරජාණන් වහන්සේ මෙසේ වදාළ සේක.

යශස්වී ගෞතම බුදුරජාණන් හන්සේ විසින් අනුත්තර ශීලය, අනුත්තර සමාධිය, අනුත්තර ප්‍රඥාව, අනුත්තර විමුක්තිය යන මේ ධර්මයෝ අවබෝධ කරන ලදහ.

මෙසේ බුදුරජාණන් වහන්සේ විශිෂ්ඨ ඥානයෙන් දැන භික්ෂූන්ට ධර්ම දේශනා කළ සේක. වෘත්තදුඃඛය අන්තකරණ පසැස් ඇති ශාස්තෘන් වහන්සේ (ක්ලේශ පරිනිර්වාණයෙන්) පිරිනිවී යහයි.

නිමි.

## පසුවදන

පෙරවදනින් පෙන්වා දී තිබෙනවා ගින්නෙන්, ජලයෙන්, වායුවෙන් කල්ප විනාශවන ආකාරය. එයින් ගින්නෙන් කල්ප විනාශ වන ආකාරය මැනවින් පැහැදිලි කර ඇත. ග්‍රන්ථය දීර්ඝ වන තරමට දායකයන්ගේ පිට මුද්‍රණ වියදම් බර වැඩි වන්නේය. පාඨකයන්ට අගය අඩුවන්නේය. මාහට වෙහෙස වැඩිවන්නේය. එනමුත් බුද්ධිමතාට සසර අනිත්‍ය, දුක්ඛ, අනාත්ම භාවය, අස්ථිරභාවය වටහාගෙන මේ ලබාගත්තාවූ සම්බුද්ධ ශාසනයම පිහිටාධාර කරගෙන, සුනත්ත ශාස්තෘන් වහන්සේගේ ජීවිත කථාවෙන්ම පෙන්වාදෙනවා සම්බුදු රජාණන් වහන්සේ නමක් ලෝ පහළ වීමකින් තොරව නිවනක් නැති බව මෙකී සූත්‍ර දේශනාවෙන් පෙන්වා දෙන්නේ ලෝක විනාශය ගැන පමණයි. මෙවන් තවත් අපගේ භාග්‍යවතුන් වහන්සේගේ සූත්‍ර දේශනා තුලින් පෙන්වා දෙනවා ඒ විනාශ වන කල්ප (තුන් ආකාරයෙන්ම) නැවත හැදෙන ආකාරය. ඒ ගැන කෙටි විස්තරයක්, සහ ජලයෙන් හා වායුවෙන් කල්ප විනාශ වන ආකාරයත් ගැන පහතින් කෙටි විස්තරයක් ඇතුලත් කරමි.

එක කල්පයකට අතුරු කල්ප අසූවකි. (80) එනම්, වර්තමානය ජීවින්ගේ පැවැත්ම, වෘක්ෂලතාදියෙහි පැවැත්ම, සදිව්‍ය ලෝක අටමහ නරකයන් වෙතත්, වෙනත් සත්වාසයන් ආදියෙහි පැවැත්ම මෙම කාලයට අතුරු කල්ප 20 ක් ඇතුලත් වේ. එක අතුරු කල්පයක කාලය මෙසේයි. පොල් ඇට්ටියක්, කොස් ගැටයක්, පැපොල් ගැටයක් ක්‍රමානුකූලව වැඩෙන්නාසේ මේ මහා පෘථිවියද අවුරුදු දහසකට අඟලයක් වැඩෙන්නේය. එසෙ අඟල ගානේ වැඩෙන පෘථිවිය එක අතුරුකල්පයකට ගව් හතක් නොහොත් සැතපුම් 28 ක් සෑදෙන විට එක අතුරු කල්පයකි. එවන් අතුරු කල්ප 20 තුලදි සැතපුම් (560) ක් තුලදි මේ මහා පෘථිවියේ වර්ධනය අවසන් වන්නේය. එය ඉහතින් පෙන්වා දුන් පොල් ඇට්ටියේ කොස් ගැටයේ පැපොල් ගෙඩියේ උපමාවෙනි.

එය තවත් ආකාරයකින් මෙසේය. අවුරුදු අසංඛයක් (එකයි බිංදු 140 අසංඛ්‍යයකි) ආයුෂ විඳින මනුෂ්‍යයා ක්‍රම ක්‍රමයෙන් පිරිහෙමින්

ආයුෂ අඩුවී ගෙන අවුත් වර්තමානයේ ආයු අවුරුදු 76 කි) අවුරුදු 10 ට ආයුෂ ආවිට සත්‍ර විනාශයක් වන්නේය. එමසත්‍ර විනාශයෙන් ඉතාමත් සුළු සත්ව කොටසක් ඉතිරිවීමෙන් ඔවුන් නැවත ගුණධර්ම පුරමින් නිති පන්සිල් රකිමින් මව්පිය උපස්ථානාදිය කරමින් ක්‍රමානුකූලව නැවත අවුරුදු අසංඛ්‍යය දක්වා ආයුෂ වර්ධනය වන්නේය. මෙකී කාලය තමයි අන්තර්කල්පය නමින් හඳුන්වන්නේ. බණ පොතේ මෙම කාලය සඳහන් වන්නේ විවටට්ඨා යි යන නමින්ය. වර්තමානයේ මෙවන් අතුරුකල්ප 20 ක් ගෙවීගිය පසු මහපොලොවේ වර්ධනය අවසන් වූ පසු පැසී, ඉදී කුණුවෙන කොස් ගෙඩිය සෙයින් කල්ප විනාශය ආරම්භ වන්නේය.

ඉහතින් පෙන්වා දුන් ආකාරයට ඉරවල් 7 ක් පායා මහාමේරු පර්වතය සහ මේ මහපොලොව පුළුස්සා අළු බිඳුවකුදු ඉතුරු නොවන්නට අතුරු කල්ප 20 ක් ගෙවෙන්නේය. ඉන් අනතුරුව එසේ විනාශ වූ පෘථිවිය, සිනේරු පර්වතය, සදිව්‍ය ලෝක අට මහ නිරයන් ඉර, සඳ, ග්‍රහලෝක, නැකැත්තරු බ්‍රහ්මලෝක තුන ආදිය නැතිව හිස් බොල් අඳුරු ආකාශය තවත් අතුරු කල්ප 20 ක් නිහඬව පවතින්නේය.

ඉන්පසු ඉතිරි අතුරු කල්ප 20 තුල නැවත වර්තමානයේ අප සිටින තත්වයට මේ විනාශ වී ගිය වස්තු නැවත යථා තත්වයට පත්කිරීමේ කාලයයි අතුරු කල්ප 40 ක් තුල වැසි බිඳුවකුදු නොලැබුණු අපගේ මේ සක්වල ඇතුලු කෝටියක් සක්වලට සම්පත්ති කර මේඝය ප්‍රථමයෙන් පෙනේරයකින් සැලෙන කුඩා පිටි අංශු පරිද්දෙන් පටන්ගෙන ක්‍රමානුකූලව තල්කඳක් සේ මහත් වූ ජලධාරාවන්ගෙන් මේ විශ්වය පුරවන්නේය. ඉන්පසු වැවර ගෙඩිය කුරුම්බා, කළටි, පොල් බවට පත්වන්නා සේ මහත් වූ වායුව විසින් හාත්පසින් තෙරපවමින් බඹලෝ ආදිය ඒ ඒ තිබුණු ස්ථානවල පිහිටවමින් එන්නේය.

අපගේ පෘථිවියට අයත් ජල සාගරය තද අන්ධකාරයේ තිබෙන විට මේ මහා පෘථිවියේ පළමුවෙන්ම ජය ශ්‍රී මහා බෝධිය පිහිටන ස්ථානයේ එම කල්පයෙහි බුදුරජාණන් වහන්සේලා පහළ වන්නේ නම් ඒ පහළවන බුදුරජාණන් වහන්සේලා වෙනුවෙන් විශාල නෙළුම් පඳුරක් ඇති වී එම ප්‍රමාණයට මල් පිපී ඒ මත අටපිරිකර පිහිටන්නේය. නොඑසේ නම් හිස්ව තිබෙන්නේය. එවිට අකනිට්ඨා බ්‍රහ්මලෝකයේ

බ්‍රහ්ම රාජ්‍යයන් ස්ව ශරීරාලෝකයෙන් අවුත් නෙළුම් මල් පිපි තිබුනොත් සතුටින් ඒ පිට තිබෙන අටපිරිකර ඒ බෝසතාණන් වහන්සේලාට බුදුවන දවසේ පූජා කිරීම සඳහා රැගෙන යන්නේය. නොඑසේ නම් අඳුරු කල්පයක් යයි කියා දුකින් යන්නේය.

මෙයකාරයට හත්වාරයක් ගින්නෙන් කල්පය විනාශ වූ පසු අටවන වාරය ජලයෙන් විනාශ වන්නේය. එය ගින්නෙන් විනාශ වනවාටත් වඩා දරුණුය. පසුගිය කාලයේ පැමිණි සුනාමිය උපමාවට ගෙන එම සුනාමියවන් කෝටි ගණනක ප්‍රබලතාවයෙන් ජල පහර තද පරුෂ වන්නේය. ගින්නෙන් විනාශ වනවිට බ්‍රහ්ම ලෝක තුන දක්වා පමණනි. ජලයෙන් විනාශවන අවස්ථාවේ මහා බ්‍රහ්ම ලෝකයට ඉහළින් තිබෙන පරිත්තාභානං, අප්පමාණා භානං, ආභස්සරාණං යන ඉහ්මලෝක තුනද ජලයෙන් විනාශ වන්නේය.

මෙසේ හත් වතාවක් ගින්නෙන් කල්ප විනාශය වූවාට පසු අටවන වාරයේ ජලයෙන් සහ නැවත ගින්නෙන් එයාකාරයට හැටතුන් වතාවක් ගින්නෙන් සහ ජලයෙන් විනාශ වන කල්ප හැට හතර වන වාරයේදී වායුවෙන් විනාශ වන්නේය.

එසේ වායුවෙන් හැටහතර වන වර ලෝකය විනාශ වූ පසු නැවත ගින්නෙන් ජලයෙන් පෙර සඳහන් ආකාරයට එන්නේය. අපිත් සංසාරයෙන් මිදීමක් තවමත් නැතිව සැරිසරන්නේය. වායුවෙන් කල්ප විනාශය වන වකවානුවේදී වේහප්පල බඹලොවින් පහළ තිබෙන පරිත්තසුභා, අප්පමාන සුභානං, සුභකිණ්හකාණං කියන බ්‍රහ්ම ලෝක තුනක් සමග බ්‍රහ්ම ලෝක නමයක් විනාශයට පත් වන්නේය.

ගින්නෙන් කල්ප විනාශය සිදුවන විට බ්‍රහ්ම පාරිසජ්ජය, බ්‍රහ්ම පුරෝහිත , මහා බ්‍රහ්ම ඇතුළු සදිව්‍යලෝක මහා පෘථිවිය, මහාමේරු පර්වතය, ඇසුරු කරගෙන වසන සත්වයන්ගෙන් නියත මිත්‍යාදෘෂ්ඨි ගත්තවුන් හැර අනෙක් සැම සියලු සත්වයෝම ආභසසර බඹලොව දක්වා ධ්‍යාන වඩා පහළ වන්නේය. ජලයෙන් කල්ප විනාශය වන කාලයේදී මෙකී පිරිසට අමතරව පරිත්තාභානං, අප්පමාන සුභානං,

ආභස්සරාණං යන බ්‍රහ්මලෝක ඇසුරු කරගෙන වසන බ්‍රහ්මයන්ද සුභකිරණ්හකානං බඹලෝ දක්වා ඉහළට ධ්‍යාන වඩා පහළ වන්නේය.

මෙසේ ගින්නෙන් ජලයෙන් 63 න් වතාවක් කල්ප විනාශය සිදුවූවාට පසු දරුණුම කල්ප විනාශය වන වායුවෙන් 64 වන වාරයේදී සිදුවන්නේය. එවිට 7 - 8 - 9 වන බ්‍රහ්ම ලෝක තුන වන පරිත්ත සුභානං, අප්පමාන සුභානං, සුභකිණ්හකානං හි වසන සත්වයෝද මහා කල්ප 500 කට ආයු ඇති දහවන බඹලොව වන වේහප්පලය දක්වා ධ්‍යාන වඩා එහි වසන සත්වයන්ට එක්වන්නාහ.

මෙයාකාරයට වන්නේ ඇයි? ඒ ඒ බ්‍රහ්ම ලෝකවල ආයුෂ අනුවය. මේ කියවන ඔබද ලියන මමද අපගේ ගෞතම බෝසතාණන් වහන්සේ සුමේධ තාපසව නියත විවරණ ලද සතර අසංඛ්‍ය කල්ප ලක්‍ෂය නොව තම මව පිට මත තබාගෙන පරක් තෙරක් නොපෙනෙන මහා සාගරයේ පිහිනපු 20 අසංඛ්‍ය කල්පයකටත් ඈත සිට තවමත් භව තාෂ්ණාවෙන් මිදුනේ නැත. එසේ මිදෙන්න අවශ්‍ය නම් මෙන්න අවස්ථාව මෙම සම්බුද්ධ ශාසනය තුල අප්‍රමාන කුසල් කරගෙන බුද්ධ, ධම්ම, සංඝ රත්නය කෙරේ විචිකිච්ඡා නොඉපදවා ගරු කරමින් නිති පඤ්චශීලය ආරක්‍ෂා කරගෙන ප්‍රාණඝාතයෙන් පමණක් නොව එයට අනුබල දිමෙන්ද වැළකුනොත් මෙම කල්පයේ අවසානයට පහළ වන මෛත්‍රී පිඩක් වූ මෛත්‍රී බුදු සසුන තුල සියලුම සංසාර බන්ධනයන්ගෙන් මිදිමට අවස්ථාව උදාවේ.

මිට මෙතැති,

**පූජ්‍ය අකුරේගොඩ රතනසාර හිමි**
**ගුණරත්න යෝගාශ්‍රමය,**
**තල්වත්ත, කැළණිය.**

බුද්ධ වර්ෂ 2558 බක් පුර පසළොස්වක දින
ක්‍රි. ව. 2016. 04. 21 .


සංස්කරණය
පූජ්‍ය අකුරේගොඩ රතනසාර හිමි.